**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# ප්‍රධාන මානව සම්පත් නිලධාරි තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

## 1.0 කාර්යය / වගකීම්:

### දැක්ම

- ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීමට උපකාරී වන පරිදි ප්‍රශස්ත ඉදිරි මානව ප්‍රාග්ධන සැලසුමක් සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හා උපාය මාර්ග සැකසීම සඳහා නායකත්වය දීම සහ මෙහෙයවීම.
- මානව සම්පත් දෙපාර්තමේන්තුව සතු සම්පත් සහ අනෙකුත් ක්‍රමෝපායික ක්‍රියාකාරකම් බැංකුවේ අපේක්ෂිත ප්‍රතිඵල සමඟ, සමස්ත ලෙස ඒකාබද්ධ සහ අනුකූල වන බව තහවුරු කිරීම සඳහා මඟ පෙන්වීම, මෙහෙය වීම සහ පාලනය කිරීම.

### ජාල සහ සම්බන්ධතා

- බාහිර විශේෂඥයකු (විශේෂඥයන්) ගේ සහභාගීත්වයෙන් මානව ප්‍රාග්ධන විසඳුම් වැඩි දියුණු කිරීම සඳහා මානව ප්‍රාග්ධන සංවිධාන, උපදේශකයින් හා මානව ප්‍රාග්ධන වෘත්තිකයන් සමඟ උපායමාර්ගික සම්බන්ධතා ගොඩ නැගීම සහ පවත්වාගෙන යෑම.
- විවිධ මානව ප්‍රාග්ධන ක්‍රියාවලි සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව, අනෙකුත් ප්‍රධාන දෙපාර්තමේන්තු සහ කළමණාකාරීත්වය තුළ දැනට පවතින සබඳතා උපයෝගී කර ගැනීම සහ නව සබඳතා ගොඩනගා ගැනීම .

### උපදේශනය

- මහ බැංකුවට පැවරී ඇති කාර්යයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා මානව ප්‍රාග්ධන ක්‍රමෝපායයන් සහ භාවිතයන් සම්බන්ධ කරුණු පිළිබඳ ව කළමනාකාරීත්වයට උපදෙස් දීම සහ කළමනාකාරීත්ව සහාය ලබා ගැනීම.
- බැංකුවේ ප්‍රධාන මානව ප්‍රාග්ධන අධිකාරිය ලෙස කටයුතු කිරීම සහ සියලු දෙපාර්තමේන්තු සඳහා තොරතුරු ලබා ගත හැකි කේන්ද්‍රස්ථානය හා උපදේශකයකු ලෙස කටයුතු කිරීම.

### ගැටලු හඳුනාගැනීම සහ නිරාකරණය

- බැංකුවේ සමස්තයක් ලෙස පවතින ගැටලුවලට පිළියම් යෙදීම සඳහා නවීන සහ සූක්ෂ්ම මානව ප්‍රාග්ධන විසඳුම් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම.

## 2.0 අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:

### 2.1 අධ්‍යාපන සුදුසුකම්:

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් මානව සම්පත් කළමනාකරණය/ මානව ප්‍රාග්ධනය/ මනෝ විද්‍යාව පිළිබඳ (අවම වශයෙන් වසර (03) ක) විශේෂ උපාධියක්

**සහ/හෝ**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක්

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලබන මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීමය සුදුසුකම් සතු වීම අමතර සුදුසුකමක් වනු ඇත.

### 2.2 පළපුරුද්ද:

මානව සම්පත් ක්ෂේත්‍රයෙහි, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව ධුරයක වසර 10ක අවම පළපුරුද්දක් ඇතුළු ව වසර 15ක අවම පළපුරුද්දක්. මානව සම්පත් පරිවර්තන (HR Transformation) / වෙනස්කම් කළමනාකරණය (Change Management) / ආයතනික සංවර්ධනය (Organizational Development) පිළිබඳ පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත. 500 ට නොඅඩු ශ්‍රම බලකායක් සහිත පිළිගත් ආයතනයක මානව සම්පත් අංශය සඳහා නායකත්වය ලබා දුන් ප්‍රධාන නිලධාරියෙකු ලෙස සැළකිය යුතු කාලයක අත්දැකීම් සහිත වෘත්තිකයන් සඳහා වැඩි අවධානයක් යොමු කෙරනු ඇත.

### 2.3 යෝග්‍යතාවය සඳහා අමතර කුසලතා:

- ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සහ පරිවර්තනය යන ක්ෂේත්‍රයන් පිළිබඳ පළපුරුද්ද
- ක්‍රමෝපායික චින්තනය සහ නායකත්ව කුසලතා
- කාර්ය අධ්‍යයන, කාර්ය ක්‍රියාවලි විශ්ලේෂණය සහ රැකියා ඇගයීම පිළිබඳ පළපුරුද්ද
- මානව ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ තාක්ෂණික ප්‍රවීණතා
- සන්නිවේදන සහ අන්තර් පුද්ගල කුසලතා, අනුවර්තනය වීමේ හැකියාව සහ නම්‍යශීලී බව, කාර්මික සම්බන්ධතා කළමනාකරණය, සංඛ්‍යාත්මක සාක්ෂරතාව
- මානව සම්පත් දත්ත විශ්ලේෂණය, මනෝමිතික පරීක්ෂණ සහ නිපුණතා ඇගයුම්කරණය පිළිබඳ පළපුරුද්ද

**අයදුම්පත සමග අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය**

## 3.0 රැකියාව:

කොන්ත්‍රාත් පදනම මත වසර (02) ක කාලයක් සඳහා බඳවා ගැනේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවය මත මෙම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සලකා බැලෙනු ඇත.

## 4.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

ක්ෂේත්‍රයේ මේ හා සමාන තනතුරුවලට ගෙවනු ලබන වැටුපට සමගාමී ව ආකර්ෂණීය වැටුපක් ලබා දෙනු ඇත. (වැටුප සාකච්ඡා කොට තීරණය කරගත හැකිය).

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින් තෝරා ගැනෙනු ඇත

## අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.08.16 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

අයදුම්පත් එවීමේදී “ප්‍රධාන මානව සම්පත් නිලධාරි තනතුර (කොන්ත්‍රාත් පදනම මත)” යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කරගනු නොලැබේ. තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.

බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සළකා බලනු ලැබේ.

**අධ්‍යක්ෂ – මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දුරකථන: 011-2477330  ෆැක්ස්: 011-2477715**